මාධ්‍ය නිවේදන අංක 16

මැතිවරණ කොමිෂන් සභාව

# මාධ්‍ය නිවේදනය

පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ මැතිවරණ කොමිෂන් සභාවේ දී අද දින (2022.08.08) පැවති රැස්වීමේ දී මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීතිරීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් ලබා දී තිබෙන නිර්දේශවලින් අතිබහුතරයක් ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම පක්ෂ පොදු එකඟතාවකට පැමිණිනි.

එයට අමතරව ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ප්‍රථම මැතිවරණය/ ඡන්ද විමසීමට පූර්වයෙන් එකී නිර්දේශ අතුරින් මතු දැක්වෙන නිර්දේශ කඩිනමින් සම්මත කොට ක්‍රියාත්මක කිරීමට ද එම රැස්වීමේ දී එකඟතාවට එළඹුණි.

- මැතිවරණ වියදම් පාලනය.
- පූර්ව ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සැලසීම හා ඡන්ද විමසීම් දිනයේ විශේෂ ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම.
- මහජන නියෝජිත ආයතනවල තරුණ/ කාන්තා නියෝජනය ශක්තිමත් කිරීම.
- ඡන්ද විමසීම් කාල සීමාවේ දී සියලුම මාධ්‍ය සඳහා මාධ්‍ය උපමාන බලාත්මක කිරීම.
- මහජන නියෝජිත ආයතනවල සභික ධුර කාලය අවසන් වන තෙක් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ආචාර ධර්ම වලංගුව පැවතීම හා එයට නීතිමය බලයක් ලබාදීම.

මෙ සඳහා ඉදිරි වැඩපිළිවෙලක දී සක්‍රිය සහයෝගය ලබාදීමට හා මැතිවරණ කොමිෂන් සභාව සමඟ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පොදු වැඩපිළිවෙලක් සමඟ කටයුතු කිරීමට ද එකඟතාව පළකර සිටින ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

2022.08.08